# ප්‍රසම්පාදන දැන්වීම

## ඌව පළාත් සභාව

## නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය සහිත ඌව පළාත් පරිපාලන සීමාව තුල පදිංචි සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් තරඟකාරී ලංසු කැඳවීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | කර්මාන්තයේ නම | අවශ්‍ය අවම CIDA ශ්‍රේණිය (ගොඩ නැගිලි ඉදිකිරීම්) | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ මුදල (මුදලින් ගෙවන්නේ නම්) (රු.) | ඉදිකිරීම් කාල පරාසය (දින ගණන) | ලංසු ලියවිලි ගාස්තු මුදල (රු.) | ලංසුපත් නිකුත් කරන කාර්යාලය |
|---|---|---|---|---|---|---|
| 1 | බතලයාය ආයුර්වේද රෝහලේ යෝජිත බාහිර රෝගී අංශය සහ වාට්ටු සංකීර්ණය ඉදි කිරීම. | C5 | 195,000.00 | 280 | 5,000.00 | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලය, පිං අරාව, බදුල්ල |
| 2 | කැප්පටිපොළ සහතික කල පාසලේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | C5 | 200,000.00 | 280 | 5,000.00 | |
| 3 | කතරගම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංචාරක නිවාසය ඉදි කිරීම. | C5 | 140,000.00 | 280 | 5,000.00 | |
| 4 | වැල්ලවාය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදි කිරීම. | C6 | 110,000.00 | 240 | 5,000.00 | |
| 5 | බිබිල මැදගම සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම | C6 | 85,000.00 | 240 | 5,000.00 | |
| 6 | මහියංගන පරිවාස කාර්යාලය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම | C6 | 75,000.00 | 240 | 5,000.00 | |
| 7 | රාවණා ඇල්ල නැරඹුම් මැදිරිය ඉදි කිරීම | C6 | 70,000.00 | 270 | 5,000.00 | |
| 8 | කතරගම ඌව පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව සඳහා ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C6 | 65,000.00 | 240 | 5,000.00 | |
| 9 | බඩල්කුඹුර ආයුර්වේද ඔසු උයන සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C6 | 50,000.00 | 240 | 3,000.00 | |
| 10 | ලුණුගල බ/කලෙයිමගල් දෙමළ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම | C6 | 105,000.00 | 210 | 5,000.00 | "ළඟම පාසැල හොඳම පාසැල" වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් ඒකකය, පිං අරාව, බදුල්ල |
| 11 | බ/ දියතලාව මහා විද්‍යාලයේ විදුහල්පති නිළ නිවස හා විද්‍යාගණිත e පුස්තකාල ගොඩනැගිල්ලඉදිකිරීමේ කර්මාන්තයන්හි ඉතිරි වැඩ කොටස් නිමකිරීම. (අධ්‍යාපන කලාපය- බණ්ඩාරවෙල) | C6 | 65,000.00 | 90 | 5,000.00 | |
| 12 | බ/ පිටරත්මලේ අංක 01 දෙමළ විද්‍යාලයේ ගුරු නිවාස අළුත්වැඩියාව (අධ්‍යාපන කලාපය- බණ්ඩාරවෙල) | C8 | 12,000.00 | 90 | 3,000.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | මො/ බදුළුගම්මන කණිෂ්ඨ විද්‍යාලයේ වැසිකිලි ඒකක 01 ක් ඉදිකිරීම හා මො/ මොණරවාන කණිෂ්ඨ විද්‍යාලයේ වැසිකිලි ඒකක 01 ක් ඉදිකිරීම යන කර්මාන්තයන්හි ඉතිරි වැඩ කොටස් නිමකිරීම. | C8 | 14,000.00 | 90 | 3,000.00 | |
| 14 | මො/ සෙල්ලකතරගම මහා විද්‍යාලයේ ආපනශාලාව ඉදිකිරීමේ කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් නිමකිරීම. (අධ්‍යාපන කලාපය- තණමල්විල) | C8 | 20,000.00 | 90 | 3,000.00 | |
| 15 | මො/කුමාරදාස මහා විද්‍යාලයේ වැසිකිලි ඒකක 2 ඉදිකිරීමේ කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් නිමකිරීම. (T/2-1,T/5-1) – (අධ්‍යාපන කලාපය- වැල්ලවාය) | C8 | 13,000.00 | 90 | 3,000.00 | |
| 16 | බල්ලකැටුව දිසා රෝහලේ නව වාට්ටු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් නිමකිරීම. | C7 | 40,000.00 | 90 | 3,000.00 | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
| 17 | බොරලන්ද ප්‍රාදේශීය රෝහලේ වහල අලුත්වැඩියා කිරීම. | C7 | 25,000.00 | 150 | 3,000.00 | |
| 18 | එගොඩවෙල සායන මධ්‍යස්ථානය ඉදි කිරීම | C8 | 24,500.00 | 180 | 3,000.00 | බදුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |

01. ඉහත වගුවේ සඳහන් කර ඇති පරිදි ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අවම ශ්‍රේණියේ හෝ ඉහළ ශ්‍රේණියක සහ අදාල ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත අසාධු ලේඛණ ගත නොවූ සාර්ථක, යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් ලංසු ප්‍රදානය සඳහා සුදුසුකම් ලබති.

02. ලංසු ඇගයීමේදී පහත සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.

I. පසුගිය වසර පහ තුල සිවිල් වැඩ වටිනාකමින් 60%ක් හෝ ඊට සමාන එක් කර්මාන්තයක් ඉටුකර ඇති පළපුරුද්ද **(ඉහත වගුවේ අවම අවශ්‍ය සීඩා ශ්‍රේණිය C7 හා C8 ඉල්ලා ඇති කර්මාන්ත සඳහා මෙම කොන්දේසිය අදාළ නොවේ)**
II. පසුගිය වසර පහ තුල ඉහත ඉදිකිරීමේ සිවිල් වැඩ වලට සමානව පවත්වාගෙන ගිය සාමාන්‍ය පිරිවැටුම.
III. මුල්‍යමය හැකියාව.
IV. දැනට කර ගෙන යන වැඩ වල මුල්‍ය හා භෞතික ප්‍රගතිය

03. ලංසු වටිනාකම රුපියල් මිලියන 05ක් හෝ ඊට වැඩි අගයක් සහිත කර්මාන්ත සඳහා **1987 අංක 03 දරන** පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර, ලංසු සමඟ එම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය. එම ලියාපදිංචි සහතිකය අමුණා නොමැතිවීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට **2018.09.20 සිට 2018.10.12** දින දක්වා ඉහත වගුවේ සඳහන් කාර්යාල වෙත ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ආකෘතිපත් වල සම්පූර්ණ ඉංග්‍රීසි භාෂාමය පිටපතක් කාර්යාල වේලාවන් තුළ ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ලියවිලි ගාස්තුව ගෙවීමෙන් පසු ලබා ගත හැකි අතර, අයකිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.

05. ලංසු සුරක්ෂණය මුදලින් නොගෙවන්නේනම් ලංසු සමඟ ලංසු සුරක්ෂණ ඇපකරයක් අමුණා එවිය යුතුය. **ලංසු සුරක්ෂණය** සඳහා වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ මුදල මෙන් ***දෙගුණයක්*** වටිනාකමින් යුත් **ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමත කළ වාණිජ බැංකුවකින් ලබාගත් ඇපකරයක් ඉදිරිපත් කල හැකිය. මෙය කොන්දේසි රහිතව ඉල්ලූවිට ගෙවනු ලබන ඇපකරයක් විය යුතුය.**

06. ලංසු ඇපකරය 2019 .02.15 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

07. ලංසු 2019 .01.15 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

08. නිසි පරිදි සම්පූර්ණ කරන ලද **ලංසු පිටපත් දෙකකින්** යුතුව අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත 2018 -10-15 වැනි දින ප.ව.2.00 ට පෙර ඉදිරිපත් කළ යුතු අතර, ලංසුපත් වල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා, ඉහළ වම් කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කර මුද්‍රා තබා, **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, පිංඅරාව, බදුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතු අතර ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. **2018-10-15 දින ප.ව.2.00 ට බදුල්ල, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේදී** ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයින්ට සහභාගි විය හැක.

10. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසු කරුවන් හට වැඩිදුර තොරතුරු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් **055–2222218**, ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයට අයත් **055-2229629**,"ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ඒකකයට අයත් **055-4934101**, ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) මොණරාගල කාර්යාලයට අයත් **055–2276038**, ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) බදුල්ල කාර්යාලයට අයත් **055–2224753**, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් **057-2222025**, වැල්ලවාය ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් **055-2274362** හා බිබිල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් **055–2265317** යන දුරකථන අංක වලින් ලබා ගත හැක.

11. ලංසු කැඳවීම සම්බන්ධ පූර්ව ලංසු රැස්වීමක් (Pre Bid Meeting), **2018-10-03 දින පෙ.ව.10.00 ට බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේදී** පැවැත්වෙන අතර, එහිදී අපේක්ෂිත ලංසුකරුවන්ට ව්‍යාපෘති අවශ්‍යතා සම්බන්ධව පැහැදිලි කිරීම් ඉල්ලා සිටිය හැක. තවද අවශ්‍ය නම් වැඩ බිම් සංචාරයක්ද පිළියෙල කල හැක.

12. ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,**
**පිංඅරාව, බදුල්ල**
**දු.ක / ෆැක්ස් අංකය - 055-2222218, ඊ.මේල්-** dcsengupc@gmail.com
දිනය: 2018.09.18